ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2018 ජුනි 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 මැයි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ඩී.ජී.එස්.ජී.මුණසිංහ මහතා 2018 මැයි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2.1%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 1.6%ක් ලෙස වාර්තා විය. තවද 2018 මාර්තු මාසයේ සිට අඛණ්ඩව මාස තුනක් උද්ධමනය 3.0%ට වඩා අඩු අගයක් වාර්තා විය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.02%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.05%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 මැයි මාසයේ 7.1% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.6%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.5%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 අප්‍රේල් මාසයේ 122.9ක් වූ දර්ශකාංකය 2018 මැයි මාසයේ 124.3ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 මැයි මාසයේ දර්ශකාංකය 1.4ක වැඩිවීමක් එනම් 1.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.55%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.61%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, අළුත් මාළු, ලොකුළූණු, දෙහි, අර්තාපල්, කුකුල් මස්, බිත්තර, කරවල, අමු මිරිස්, ඉඟුරු, ළදරු කිරිපිටි සහ කිරිපිටි යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පොල්, කෙසෙල්, පැපොල්, අඹ, සුදුළූණු, සහල් සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 මැයි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'විවිධ භාණ්ඩ හා සේවා', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 2018 මැයි 11 සිට ඉන්ධන මිල ඉහළ දැමීම ප්‍රධාන වශයෙන් හේතු විය. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 2018 අප්‍රේල් 28 සිට LP ගෑස් මිල ඉහළ දැමීම හා මැයි 11 සිට භූමිතෙල් මිල ඉහළ දැමීම හේතු විය. එසේ වුවත් පසුගිය මාසය හා සසඳන විට 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීමක් වාර්තා විය. මෙම මස තුළ 'සන්නිවේදන', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල් යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවිය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජුනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව